**පලාගල ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පලාගල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ඉදිරිපත් කර ඇති අතර එහි පරිච්ඡේද ix අනුව මූල්‍ය ප්‍රකාශන, අයවැය ලේඛන තොරතුරු රහිතව ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3.7 ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ අඩු ආදායම් ලාභීන් සඳහා වටිනාකම රු.2,134,470 ක් වූ බ්ලොක් ගල් සහ කොන්ක්‍රීට් වළලු ලබාදී තිබුණු නමුත් එම වටිනාකම කොන්ක්‍රීට් නිෂ්පාදන වෙළඳ හා ලාභාලාභ ගිණුම තුළින් පෙන්වා නොතිබුණි. | පිළිගනිමි. | කොන්ක්‍රීට් නිෂ්පාදන වෙලෙඳ හා ලාභ අලාභ ගිණුම තුළින් අදාළ වියදම් ඉදිරිපත් කළයුතු වේ. |
| (ආ) | දේපල පිරියත හා උපකරණවල සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.19,121,205 ක් වුවත් DDB යටතේ ක්ෂය ගණනය කිරීමේදී Factor භාවිතා කර නොතිබීම හේතුවෙන් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.24,895,741 ක් ලෙස රු.5,774,536 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | නිවැරදිව ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.156,914 ක් විය යුතු වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.913,190 ක් ලෙස රු.756,276 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම සහ උපලේඛනවල සඳහන් වටිනාකම් අතර රු.1,349,776 ක වෙනසක්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර වත්කම් මිලට ගැනීම සහ ලෙජර් ගිණුම් අතර රු.180,021 ක වෙනසක්ද දක්නට ලැබුණි. | පිළිගනිමි. | වෙනසට හේතු සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.6,091,377 ක්වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | තොග ලේඛන හා තොග සත්‍යාපන වාර්තා පවත්වාගත යුතුවේ. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික, අනියම් සේවකයින්ගේ සේවය අවසන් කළවිට ඔවුන්ට පාරිතෝෂික ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර අදාළ වෙන්කිරීම් කර නොතිබුණි. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට කටයුතු කරමි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 177 වගන්තිය අනුව කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ (i) අංක 09 | සුසාන භූමි ලේඛන නඩත්තු කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා තාප්ප වැටවල් යොදා ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ආරක්ෂක වැටවල් යෙදීමට කටයුතු කරමි. | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 09 අනුව කටයුතු කළයුතු වේ. |
| | (ii) අංක 06 2.2 (iii) | සභාවට අයත් මාර්ග ගැසට්කර නොතිබූ අතර ගෙනයා හැකි උපරිම බර ප්‍රදර්ශනය කර නොතිබුණි. | පිළිගනිමි. | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 06 හි 2.2 (iii) ඡේදය අනුව කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආයභාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.10,159,871 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.12,486,226 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කුලී රු.245,509 ක්ද, මස්කඩ ටෙන්ඩර් ආදායම් රු.1,420,800 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩ කුලී අයකර ගැනීමට කටයුතු කරන අතර ටෙන්ඩර් මුදල් අයකිරීමට නඩු පවරා ඇත. | සියලු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| සමාලෝචිත වර්ෂයට අදාළව යන්ත්‍ර කුලියට දීම වෙනුවෙන් රු.1,592,100 ක්ද 2020 වර්ෂයේදී යන්ත්‍ර කුලියට දීම වෙනුවෙන් රු.248,200 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ කැබ්රථයක් අනතුරකට භාජනය වී තිබූ අතර ඒ සඳහා සභා අරමුදලින් රු.112,477 ක් වැයකර තිබුණු නමුත් එම අනතුරට වගකිවයුතු පාර්ශවය හඳුනාගෙන සිදුවූ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැවත මෙවැනි ගැටළු ඇති නොවීමට කටයුතු කරමි. | වගකිවයුතු පාර්ශවය හඳුනාගෙන සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2020 වර්ෂයේ ක්‍රියාත්මක වූ වැඩසටහනක් යටතේ සහන මිලට ජනතාව වෙත රු.5,165,864 ක භාණ්ඩ බෙදාදී තිබුණු නමුත් එම භාණ්ඩ බෙදාහැරීම තුළින් අයවිය යුතුව තිබුණු රු.974,127 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමි. | සියලු හිඟ මුදල් අයකිරීමට ක්‍රියාකළ යුතුවේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී මෝටර් ග්‍රේඩරය කුලියට ලබාගත් කාලයට වඩා වැඩිකාලයක් වැඩකිරීම නිසා ලැබිය යුතු රු.368,000 ක කුලී ගාස්තු අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකිරීමට කටයුතු කරමි. | ලැබීමට ඇති සියලු මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී අයදුම්පත්‍රයක් සහ කිසිදු ලිඛිත අනුමැතියක් නොමැතිව කුලී පදනමට වාහන ලබාදීමෙන් සභාවට ලැබිය යුතු රු.270,000 ක කුලී ආදායම් ලැබී නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකිරීමට කටයුතු කරමි. | ලැබීමට ඇති සියලු මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කුලී පදනම මත ධාවනය කළ යන්ත්‍ර පැය 416.2 ක් සඳහා ලැබිය යුතු රු.587,800 ක කුලී ආදායම් අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකිරීමට කටයුතු කරමි. | ලැබීමට ඇති සියලු මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරනු ලබන තක්සේරු වටිනාකම රු.4,500,000 ක්වූ වාහන 03 ක අයිතිය සභාවට පවරාගැනීමට 2021 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කරමි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | වසර 05 කට අධික කාලයක සිට සභා භූමියේ රඳවාගෙන තිබෙන අංක රහිත කැබ්රථය හා සහල්පිටි සැකසුම් යන්ත්‍රය භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේදීද සිදුකර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරමි. | නැවත භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් කසළ එකතු කිරීමක් සිදුනොකරන බැවින් බලප්‍රදේශය තුළ ජනනය වන කැළිකසළ අවිධිමත් ලෙස පරිසරයට බැහැර කරමින් පැවතුණි. | කසළ ලබාගැනීම නවතා ඇති අතර අදාළ පුද්ගලයන් මගින් කසළ ප්‍රතිචක්‍රීයකරණය කිරීමට උපදෙස් ලබාදී ඇත. | විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුවේ. |